


## බුද්ධිනී ජයවර්ධනගේ කුළුඳුල් නවකතාව

# 'සඳ කිඳුරී මං'

මාධ්‍යාවේදී බුද්ධිනී ජයවර්ධන ගේ කුළුඳුල් නවකතාව 'සඳ කිඳුරී මං' පසුගිය දා පුස්තකාලසේවා මණ්ඩල ශ්‍රවණාගාරයේදී කලාකරුවන් මාධ්‍යවේදීන් ඇතුළු විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් එළි දැක්විනි.

තිරතරු, ත්‍රිශූලේ පුවත්පත්වල විශේෂාංග ලේඛිකාවක් ලෙසින්, පුවත්පත් කලාවට පිවිසි බුද්ධිනි බිරිඳ, සඳැදිය පුවත්පත්වල නිදහස් ලේඛිකාවක් ලෙස කටයුතු කර ඇත. සත්දින ජාතික පුවත්පතේ කලා අතිරේකයේ සංස්කාරකවරිය වූයේද ඇයයි. ජනප්‍රිය ෂෝ ටයිම් සිනමා සඟරාවේ ප්‍රධාන කතුවරිය වූ ඇය, සරසවිය සිනමා පුවත්පතේද ලේඛිකාවක විය. ඇගේ පුවත්පත් කලා දිවියට වසර 15කි.

දැනට ඇය ඒෂියා ඩිජිටල් එන්ටර්ටේන්ට්මන්ට් නම් වන චිත්‍රපට නිශ්පාදන ආයතනයේ මාධ්‍ය සම්බන්ධීකාරකවරිය ලෙස සේවය කරයි.

චිත්‍රපට හා රූපවාහිනී පසුබිම් හඬකැවීම් ශිල්පිනියක වන බුද්ධිනී, ජනප්‍රිය නළු ඩොමී ජයවර්ධනගේ මිනිබිරියක වන අතර, ප්‍රවීන කලාකරුවෙකු වූ නිහාල් ජයවර්ධනගේ වැඩිමහල් දියණියයි.



මේ දිනවල බුද්ධිනී ජනප්‍රිය ගායිකා නිරෝෂා විරාජිනීගේ චරිතාප්‍රදානය ලිවීමට සැලසුම් කරමින් සිටියි.

## රොක්ස්බර්ග්පාක් සිංහල භාෂා පාසලේ දරුවන්ගේ හපන්කම්




**Ramiru Kandambi**
Grade 2
Epping View Primary School
Epping



**නෙත්මි ජයසූරිය**
7/8 ශ්‍රේණිය




**නෙත්මි ජයසූරිය**
7/8 ශ්‍රේණිය



**ඩිනුකි රාජපක්ෂ**
7/8 ශ්‍රේණිය

